# 4 සීලය, ආධ්‍යාත්මික දියුණුව හා සමාජ සදාචාරය

මෙම පාඩමෙන් අපි සීලය පිළිබඳවත් සමාජ සම්බන්ධතා පිළිබඳවත් ඉගෙන ගන්නෙමු. සීලය අපගේ අභ්‍යන්තර දියුණුව සඳහා මෙන් ම සමාජ සදාචාරය උදෙසා ද හේතු වේ. යහපත් සමාජ සම්බන්ධතා වූ කලී සාර්ථක සමාජ ජීවිතයක අනිවාර්ය අංග වේ. ඒ අනුව සීලය හා සමාජ සම්බන්ධතා එකිනෙකින් වෙන් කළ නොහැකි සේ බැඳී ඇත.

සීලය වූ කලී පෞද්ගලික ව එක් පුද්ගලයකු සම්බන්ධයෙන් නොව මිනිස් සමූහයක් හෙවත් සමාජයක් සම්බන්ධයෙන් අර්ථවත් වන්නක් බව එය විමසා බැලූ විට පැහැදිලි වේ. නිදසුනක් ලෙස, කිසි ම සත්ත්වයකුගෙන් තොර ලොවක කෙනෙකු තනි ව ම වෙසේ නම් පරපණ නැසීම පිළිබඳ හෝ සොරකම් කිරීම පිළිබඳ හෝ පරදාර සේවනය පිළිබඳ හෝ බොරුකීම ආදිය පිළිබඳ හෝ ගැටලුවක් ඔහුට පැන නොනඟී. සීලය අර්ථවත් වීම සඳහා අඩු ම වශයෙන් දෙදෙනෙකු වත් සිටිය යුතු ය. එසේ ම සමාජ සම්බන්ධතා ඇතිවනුයේ ද එක් කෙනෙකුට වඩා වැඩි ප්‍රමාණයක් මිනිසුන් හෝ සත්ත්වයන් හෝ ඇති කල්හි ය. එහෙයින් මෙම පාඩමෙන් අප ඉගෙන ගන්නේ බුදුදහමට අනුව සමාජ සදාචාරය හා සමාජ සම්බන්ධතා ගොඩ නඟන්නේ කෙසේ ද යන්නයි.

## 4.1 සීලය: පුද්ගල හා සමාජ සදාචාරය

### 4.1.1 හැඳින්වීම


ගිහියාගේ සීලය පන්සිල්, අටසිල් හා දසසිල් යනුවෙන් විවිධ ස්වරූප ගනී. ගිහි බෞද්ධයන් විසින් පන්සිල් නිතිපතා ද අටසිල් හා දසසිල් පෙහෙවය වැනි සුවිශේෂ අවස්ථාවල දී ද පිළිපදිනු ලැබේ. අපි පසුගිය 1 හා 3 පාඩම් දෙකෙන් ම සීලය පිළිබඳ නොයෙකුත් කරුණු ඉගෙන ගත්තෙමු. විශේෂයෙන් ම, සීලය ත්‍රිශික්ෂාවෙහි පදනම වන අයුරුත්, සීලයෙහි පිහිටීමෙන් පමණක් සමාධිය හා ප්‍රඥාව වැඩිය හැකි වන බවත් අපි දැනටමත් ඉගෙන ගෙන ඇත්තෙමු. (1.3 ‘ආර්ය අෂ්ටාංගික මාර්ගය’ පිළිබඳ පාඩම් ඒකකය හා 3.3 ‘සුපෞරුෂයක් සඳහා දහම් අත්වැළක්’ යන පාඩම් ඒකකය ද නැවත බලන්න.) මෙම පාඩම් ඒකකයෙන් අපි ඒවාට අමතරව සීලය ආරක්ෂා කිරීම සඳහා ඉවහල් වන මූලික ගුණාංග කීපයක් පිළිබඳවත් ශීලයෙහි සාමාජික වටිනාකම පිළිබඳවත් ඉගෙන ගන්නෙමු.

### 4.1.2 සීලය සම්පූර්ණ වන්නේ කෙසේ ද?

ශීලය යනු කයෙන් හා වචනයෙන් නිවැරැදිව හැසිරීමයි. පන්සිල්, අටසිල් හා දසසිල්වලින් එක් එක් ප්‍රමාණයට සිදුකෙරෙනුයේ මෙම කායික හා වාචසික සදාචාරය අප තුළ ඇති කිරීමයි.

සීලය සම්පූර්ණ වීම සඳහා විරති හා සමාදාන යන අංග දෙක ම තිබිය යුතු වේ. එය මෙසේ විස්තර කළ හැකි ය. පර පණ නැසීමෙන් වැළකී පර පණ නැසීමට හා හිංසා කිරීමට භාවිත කරනු ලබන අවි ආයුධ බැහැර කොට සියලු සත්ත්වයන් කෙරෙහි දයාව හා මෛත්‍රිය දක්වමින් විසීම; තමන්ට අහිමි ද ගැනීමෙන් (සොරකමෙන්) වැළකී තමන්ට හිමි දෑ පමණක් ගනිමින්, වංචාවෙන් තොර වූ පවිත්‍ර සිතින් යුතු ව වාසය කිරීම; කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී තම ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට පමණක් සීමාවෙමින් සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීම; බොරුකීමෙන් වැළකී සත්‍ය කතා කරනසුලු ව සත්‍යයෙහි ඇලී වාසය කිරීම; කේළාම් කීමෙන් වැළකී අනුන් සමගි කරවනසුලු වචන කතා කිරීම; රළු වදනින් වැළකී මුදුවදන් කතා කිරීම; හා හිස් වචන කතා කිරීමෙන් වැළකී අර්ථවත් වචන කතා කිරීම. මෙහි දී අර්ථවත් වචන

කතා කිරීම යන්නෙන් අදහස් කෙරෙනුයේ i. සුදුසුකල්හි, ii. සත්‍ය වූ iii. අර්ථවත් වූ iv. දැහැමි බව ඇතිකරන්නා වූ v. හික්මීම ඇති කරන්නා වූ වචන සීමාව නො ඉක්මවා කතා කිරීමයි. මේ ආකාරයෙන් විරති හා සමාදාන වශයෙන් පිළිපැදීමෙන් සීලය සම්පූර්ණ වේ.



## 4.1.3 සීලයට ආසන්නතම කරුණු දෙකක්

සීලයට ඉතාම ආසන්න කරුණු වශයෙන් ලැජ්ජාව (හිරි) හා බය (ඔත්තප්ප) විශුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. මෙහි දී ලජ්ජාව හා බය යනු සාමාන්‍ය ජීවිතයේ සමහර අවස්ථාවල දී අපට ඇතිවන බය හෝ ලජ්ජාව නොව පවු කිරීමට ඇති බිය හා ලජ්ජාවයි.

ලජ්ජාව හා බිය අප පවෙන් වළකාලයි. එහෙයින් බුදුරදුන් විසින් මෙම ගුණ ධර්ම දෙක ලෝවැස්සාගේ හැසිරීම පාලනය කරන කරුණු හෙවත් **ලෝක පාලක ධර්ම** ලෙස විස්තර කොට ඇත.

මේවා හැඳින්වීම සඳහා බුදුරදුන් භාවිත කොට ඇති තව ද නමක් වනුයේ **දේවධර්ම** යන්නයි. 'දෙවියන් සතු ගුණ ධර්ම' නැතහොත්, 'කෙනෙකු දේවත්වයට උසස් කරවන ගුණ ධර්ම' යන අර්ථය මේ නමෙහි ඇත.

## 4.1.4 ලජ්ජාව හා බිය ඇතිවීමට හේතුවන කරුණු තුනක්

බුදුදහමට අනුව අප **පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි** 'මම පරපණ නැසීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි' යැයි කියන විට අප කරනුයේ අපට ම පොරොන්දුවක් දීමකි. අප අපට ම දෙන පොරොන්දුවක් කඩ කරන්නේ නම් එය තමන් ම රවටා ගැනීමක් වේ. සිල් සමාදන්වීම යනු බුදුරජාණන් වහන්සේගේ ආඥාවක් පිළිපැදීමට එකඟවීමක් නොවේ. බුදුදහමෙහි ආඥාවන් නැත. එහෙයින් බුදුරදුන්ට හෝ අන් කෙනෙකුට හෝ බිය වී සිල් රැකීම සිදුවන්නේ නැත.

අප කිසියම් පුද්ගලයකුට බිය නො වුනත් අප විසින් බිය ඇති කර ගත යුතු කරුණු තුනක් බුදුරදුන් විසින් දේශනා කොට ඇත. ඉන් පළමුවැන්න නම් අප අපට ම බිය විය යුතු බවයි. ඉන් අදහස් කෙරෙනුයේ වරදක් කොට සමාජයෙන් කොපමණ හැංගී සිටීමට අපට හැකි වුවත් එය

තම සිතෙන් හැංගීමට අපට නොහැකි බවයි. මෙසේ තම සිතෙන් කරනු ලබන බලපෑමට යටත් ව සදාචාර සම්පන්න වීම **අත්තාධිපතෙය්‍ය** (තමා තමන්ගේ ම බලපෑමට යටත්වීම) යැයි කියනු ලැබේ. දෙවැන්න නම් බාහිර ලෝකය විසින් අපට කරනු ලබන බලපෑමයි. තුන්වන පාඩමේ කරණීය මෙත්ත සූත්‍රය ඉගෙනීමේ දී අපි **න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං** යනුවෙන් සමාජයෙහි වෙසෙන නුවණැත්තන් දොස් කියන කවර ම වරදක් නො කළ යුතු බව දුටුවෙමු. මෙසේ ලොව නුවණැත්තන්ගෙන් දොස් ඇසීමට සිදුවන බව සලකා වරදින් වැළකීම **ලෝකාධිපතෙය්‍ය** (ලෝකයෙහි නුවණැත්තන්ගේ බලපෑමට යටත්වීම) යැයි හැඳින්වේ. තෙවැන්න නම් බුදුරදුන් විසින් දේශනා කොට ඇති ධර්මයෙහි සත්‍යතාව මගින් කරනු ලබන බලපෑමයි. ධර්මයෙහි බලපෑමට යටත් ව ශීලය ආරක්‍ෂා කිරීම **ධම්මාධිපතෙය්‍ය** නම් වේ.

### 4.1.5 සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධිය

ශීලයෙහි 'ත්‍රිකෝටි පාරිශුද්ධිය' නම් අංශ තුනකින් හෙවත් තුන් පැත්තකින් ශීලය ආරක්‍ෂා කරන ආකාරය පිරිසිදු විය යුතු බවයි. එම තුන් ආකාරය මෙසේ ය.

i. තමා වරද කිරීමෙන් වළකියි.
ii. අනුන් එම වරදෙන් වළකයි.
iii. එම වරද කිරීමෙන් වැළකීමේ ඇති හොඳ කියයි.

මෙයින් පැහැදිලි වන අගනා කරුණක් ඇත. එනම් අප සිල්වත් වීම යනු හුදෙක් අප එක් එක් කෙනාගේ පෞද්ගලික කාර්යයක් පමණක් නොව, සමාජ කාර්යයක් ද බවයි. අනුන් එම වරදින් වළක්වාලීමත් ඒ සඳහා වැළකීමේ හොඳ කීමත් අනුන් ඉන් වැළකෙන විට ඔවුන්ට ප්‍රශංසා කොට දිරිමත් කිරීමත් වැනි බොහෝ කරුණු සීලයට අයත් ය. මේ අනුව ශීලයෙන් තම පුද්ගලික අධ්‍යාත්මික දියුණුව මෙන් ම සමාජ සදාචාරය ද ඇති වේ.

### 4.1.6 සාරාංශය

සිල්වත්වීම සඳහා අවශ්‍ය වන ලෝක පාලක ධර්ම දෙක පිළිබඳ ව ද , ඒවා ඇතිවීමට හේතු වන තම සිත, නුවණැති ලෝකයා හා ධර්මය යන කරුණු තුන කෙරෙහි තිබිය යුතු ගෞරවය ද සීලයෙහි විරතිය හා සමාදානය පිළිබඳ ව ද අපි මෙම පාඩමෙන් ඉගෙන ගනිමු.

පඤ්ච සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධිය පැහැදිලි වන සේ අපවත් වී වදාළ පැළෑනේ සිරි වජිරඤාණ මහ නා හිමියන් විසින් රචනා කරන ලද පද්‍ය පංතියක් මෙසේ ය:

1. කිසිමැ සතකු නො මරම් මම නො මරවම්
මරණ අයට කිසිසෙත් අනුබල නො දෙම්
කිසිවකු නො වෙහෙසෙම් හැමට මැ සුව පතම්
මෙ ලෙස පළමු සිකපද සපුරා රකිම්

2. අනුන් සතු නුදුන් දෙය හොරෙනි නො ගනිම්
නො ගන්වම් හොරුන්හට අනුබල නො දෙම්
තමන් සතු දෙයින් සතුටු ව දවසරිම්
දෙවැන්න ද මෙමෙන් සපුරා මැ සුරකිම්

3. මිසහසරිනිඳු දිවිහිම් කොටැ මැ | වළකිමි
දරු කලැ කුමර බඹසර නිසිසේ | පුරමි
තුරුණුවැ සඳර සතුටින් සැනසී | වෙසෙමී
මෙවිලස තෙවැන්න ද සපුරා රැක | ගනිමී

4. බොරු නො මැ කියමි අනුනුදු එහි නො මැ | යොදමි
කියනුවනට ද කිසිසෙත් අනුබල | නොදෙමි
නිසි තැනැ පමණ දැනැ ඇත්තක් මැ | පවසමි
සිවු වන සික ද මෙලෙසින් සපුරා | රකිමි

5. මත්පැන් නො බොමි නො පොවමි දුමුදු නොමැ | බොමි
බොන්නන්හට ද අනු දැනුමක් නොමැ | කරමි
මත්වන හැම දෙයින් සිහිනෙනුදු | වළකිමි
පස්වන සික ද මෙලෙසින් සපුරා | රකිමි

*(බෞද්ධ ළමයා)*

## අභ්‍යාස

1. කාය දුශ්චරිත හා වචී දුශ්චරිත පිළිබඳ විරතිය හා සමාදානය ලියා දක්වන්න.
2. ලජ්ජාව හා බය (හිරි හා ඔත්තප්ප) හේතු කොට ගෙන අප සිල්වත් වන අයුරු පැහැදිලි කරන්න.
3. ‘ලෝක පාලක ධර්ම’, ‘දේව ධර්ම’ යන වචනවල තේරුම ලියන්න.
4. හිස් වචනවලින් වැළකී කතා කළ යුතු අර්ථවත් වචනවල ලක්ෂණ දක්වන්න.

## පැවරුම්

1. සීලය සැමවිට ම අදාළ වන්නේ තනි පුද්ගලයකුට නොව සමාජයකට බව පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
2. අතිගරු පැළෑනේ මහ නා හිමිපාණන් වහන්සේ විසින් රචිත පන්සිල් පිළිබඳ පද්‍ය පංතිය කට පාඩම් කරන්න.
3. ඔබ ප්‍රදේශයෙහි තරුණ පිරිස් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා වන සංගමයක සභාපතිනිය ඔබ යැයි සිතන්න. පස්වන ශික්ෂාපදයෙහි විරති හා සමාදාන අංග යොදා ගනිමින් මත් කුඩු භාවිතය වැළැක්වීම සඳහා යෝජනාවලියක් සකසන්න.
4. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න:

| | |
|---|---|
| i. අභ්‍යන්තර | ii. සාධනාත්මක |
| iii. දේවත්වය | iv. සංවරය |

## 4.2 යහපත් සමාජ සම්බන්ධතා සඳහා බෞද්ධ ඉගැන්වීම්

### 4.2.1 හැඳින්වීම

ශීලය මගින් පුද්ගලයාගේ අභ්‍යන්තර දියුණුවත්, සමාජය තුළ සදාචාරයත් ඇති වන අයුරු අපි පසුගිය පාඩම් ඒකකයෙන් ඉගෙන ගත්තෙමු. එබඳු සදාචාරවත් සමාජයක වෙසෙන පුද්ගලයන් අතර සම්බන්ධතා ගොඩනැඟිය යුත්තේ කෙසේ ද යන්න මෙම පාඩම් ඒකකයේ දී සාකච්ඡා කරමු.

පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා පිළිබඳ ව බුදුරදුන් විසින් සූත්‍ර රාශියක් දේශනා කොට ඇති අතර ඉන් සිගාලෝවාද සූත්‍රය ප්‍රධාන වේ. උදෑසන සය දිශාවට නමස්කාර කරමින් සිටි සිගාල නම් තරුණයෙකුහට නිවැරැදි දිසා නමස්කාරය පැහැදිලි කරමින් බුදුරදුන් විසින් මෙම සූත්‍රය දේශනා කරන ලදී. ඒ අනුව:

| | |
|---|---|
| නැගෙනහිර දිසාව ලෙස | මවුපියන්ට ද, |
| දකුණු දිසාව ලෙස | ගුරුවරුන්ට ද, |
| බටහිර දිසාව ලෙස | භාර්යාවට හා දරුවන්ට ද, |
| උතුරු දිසාව ලෙස | මිත්‍රයන්ට ද, |
| යට දිසාව ලෙස | දාසයන් හා කම්කරුවන්ට ද, |
| උඩ දිසාව ලෙස | පැවිදි උතුමන්ට ද, |

නමස්කාර කරන ලෙස බුදුරදුන් විසින් සිගාලට උපදෙස් දෙන ලදී. මෙහි නමස්කාරය නම් යුතුකම් ඉටු කිරීමයි.

**මාතා පිතා දිසා පුබ්බා**
**ආචරියා දක්ඛිණා දිසා**
**පුත්තදාරා දිසා පච්ඡා**
**මිත්තාමච්චා ච උත්තරා**
**දාස කම්මකරා හෙට්ඨා**
**උද්ධං සමණබ්‍රාහ්මණා**
**ඒතා දිසා නමස්සෙය්‍ය**
**අලමත්තෝ කුලෙ ගිහී**

(සිගාලෝවාද සූත්‍රය)

සය දිසා නමස්කාරයට පෙර තම සදාචාරයත්, සමාජ චර්යාවත්, ආර්ථිකයත් සකස් කර ගත යුතු ආකාරයත්, හොඳ නරක මිත්‍රාශ්‍රය පිළිබඳවත් බුදුරදුන් විසින් කරුණු දක්වා ඇත. නිවැරදි ව සය දිශා නමස්කාර කරන්නා තුළ සාර්ථක සදාචාර, සමාජ හා ආර්ථික පසුබිමක් පැවැතිය යුතු බව ඉන් පැහැදිලි වේ. එහෙත් එම කරුණු මෙහි දී විස්තර කරනු නො ලැබේ.

### 4.2.2 ස්වාමිපුරුෂ - භාර්යා සම්බන්ධය

ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර සම්බන්ධය සමාජ ජීවිතයෙහි මූලික ඒකකය වන පවුලෙහි පදනම වේ. අනිකුත් සියලු සමාජ සම්බන්ධතාවල මූලික පදනම වනුයේ ද යහපත් හා සාර්ථක පවුල් ජීවිතය වේ. එය කුඩා දරුවන්හට වගකීමෙන් යුත් පුරවැසියන් ලෙස වැඩි දියුණු වීමට ඉතා ම හිතකර පරිසරය ද වේ. සාර්ථක පවුල් ජීවිතයක් සඳහා ස්වාමිපුරුෂයා හා භාර්යාව ඔවුනොවුනට යුතුකම් ඉටු කළ යුතු ය. සිගාලෝවාද සූත්‍රයෙහි ස්වාමිපුරුෂයා විසින් බටහිර දිසාව වන භාර්යාවට සැලකිය යුතු ආකාර පහක් දක්වා ඇත.

1. ගරු සැලකිලි දැක්වීම
2. අවමන් නො කිරීම
3. වෙනත් ස්ත්‍රීන් සමග අයථා සම්බන්ධතා ඇති කර නො ගැනීම
4. වගකීම් පැවරීම
5. ආභරණ දීම

ස්වාමිපුරුෂයා විසින් මෙසේ සලකනු ලබන කල්හි භාර්යාව තම ස්වාමිපුරුෂයාහට ආකාර පහකින් තම යුතුකම් ඉටු කළ යුතු ය.

1. කටයුතු මනා ලෙස සංවිධානය කිරීම
2. සහායක පිරිසට හොඳින් සංග්‍රහ කිරීම
3. වෙනත් පිරිමින් සමග අයථා සම්බන්ධතා ඇති කර නො ගැනීම
4. රැස් කරන ලද ධනය ආරක්‍ෂා කිරීම
5. දක්‍ෂ හා අනලස වීම (අලස නො වීම)



මෙම ස්වාමිපුරුෂ භාර්යා යුතුකම් සමූහය විමසා බලන විට පෙනී යන්නේ ඒවා ඕනෑම කාලයක ඕනෑම සමාජ පරිසරයක් සඳහා අදාළ බවයි. ස්වාමිපුරුෂයාගේ හා භාර්යාවගේ අන්‍යොන්‍ය යුතුකමක් ලෙස දක්වා ඇති වෙනත් ස්ත්‍රියක හෝ වෙනත් පුරුෂයකු සමඟ අයථා සම්බන්ධකමක් ඇති කර නො ගැනීම වූ කලී විවාහ ජීවිතයෙහි පදනම වේ. මෙම කාරණය දෙදෙනාට ම පොදු කරුණක් සේ දක්වා තිබීම ඉතා වැදගත් ය. ස්වාමි පුරුෂයාගේ යුතුකම් ලෙස දක්වා ඇති අනිත් කරුණු හතර ද එදාට මෙන්ම අදටත් එක සේ අදාළ වේ. පළමුවන, දෙවන හා සතරවන කරුණු ඉටු කර ගැනීම සඳහා වර්තමාන ලෝකයෙහි කාන්තා විමුක්ති ව්‍යාපාර මඟින් සියවස් කීපයක සිට සටන් කරන බව අපි දනිමු. එහෙත් බුදුරදුන් එම කරුණු අදින් සියවස් විසිපහකටත් පෙර දක්වා තිබීමෙන් පෙනෙනුයේ උන්වහන්සේගේ චින්තනයෙහි පුළුල් බවයි. වගකීම් පැවරීම යන සිවු වන කරුණෙන් දක්වා ඇත්තේ ගෘහාශ්‍රිත කටයුතුවල දී මෙන් ම වෙනත් අදාළ අවස්ථාවල දී ද තීරණ ගැනීමේ යම් බලයක් කාන්තාවට පැවරිය යුතු බවයි. මේ වූ කලී ඉතා නවීන ලෙස කාන්තාවගේ තත්ත්වය පිළිබඳව සැලකීමක් වේ. ආභරණ ලබා දීම මගින් භාර්යාව කෙරෙහි තමා දක්වන සැලකිල්ල හා ආදරය පෙන්වීමට ස්වාමිපුරුෂයාට අවස්ථාව ලැබේ. එසේ ම එමගින් පොදුවේ කාන්තා මානසිකත්වය ගැන සැලකිල්ලක් දැක්වීම ද වේ.

සාර්ථක පවුල් ජීවිතයක් සඳහා ස්වාමි භාර්යා දෙදෙන සමාන අදහස්වලින්, සමාන ගුණධර්මවලින් හා සමාන චර්යාවලින් යුතුවීමේ අගය බුදුරදුන් විසින් අවධාරණය කොට ඇත. එසේ සමාන වීම හෝ නොවීම මත පවුල් ජීවිත සතරාකාර වන බව උන්වහන්සේ විසින් පෙන්වා දී ඇත.

1. පිරිමි මළ කඳක් ස්ත්‍රී මළ කඳක් හා එකට විසීම. **(ඡවෝ ඡවාය සද්ධිං සංවසති)**
2. පිරිමි මළ කඳක් දෙව්දුවක හා එකට විසීම. **(ඡවෝ දේවියා සද්ධිං සංවසති)**
3. දිව්‍ය පුත්‍රයෙක් ස්ත්‍රී මළ කඳක් හා එකට විසීම. **(දේවෝ ඡවාය සද්ධිං සංවසති)**
4. දිව්‍ය පුත්‍රයෙක් දෙව් දුවක හා එකට විසීම. **(දේවෝ දේවියා සද්ධිං සංවසති)**

(චතුසංවාස සූත්‍රය)

මෙහි මළ කඳකට සමාන කොට ඇත්තේ පස්පව් දස අකුසල් කරමින්, දුශ්ශීල ව, ශ්‍රද්ධාවෙන් තොර ව, මසුරු මලින් අපවිත්‍ර වූ සිතින් යුතු ව, පැවිද්දන්හට නිග්‍රහ කරමින් ගිහිගෙයි වසන පුරුෂයා හෝ ස්ත්‍රියයි. දිව්‍ය පුත්‍රයකුට හෝ දෙව් දුවකට හෝ සමාන කොට ඇත්තේ පස්පවින් දසඅකුසලයෙන් වැළකී, සිල්වත් ව, ශ්‍රද්ධාවෙන් යුතු ව, මසුරු මලින් තොර ව,

පැවිද්දන්හට නිග්‍රහ නො කරමින් ගිහිගෙයි වසන පුරුෂයා හෝ ස්ත්‍රියයි. සදාචාරය අතින් පරිහානියට පත් වූ පුරුෂයකු හා එබඳු වූ ම ස්ත්‍රියක අතර ජීවිතය මළ කඳවල් දෙකක් එකට විසීම වැන්න. සදාචාර සම්පන්න ස්ත්‍රී පුරුෂ දෙදෙනකුගේ එක්ව විසීම දිව්‍යමය සම්බන්ධයක් ලෙස බුදුදහම අගය කරයි.

### 4.2.3 ස්වාමි - සේවක සම්බන්ධය

ස්වාමි සේවක සම්බන්ධය කඩා වැටීම හේතුවෙන් ඇතිවන ගැටලු අප සමාජයෙහි බහුල ය. නිතර ඇසීමට හා දැකීමට ලැබෙන වැඩ වර්ජන, විනාශකාරී ක්‍රියා, මහජන දේපළ හානි ආදිය මෙම සම්බන්ධය නිසියාකාර ව නො පවතින බව පිළිබඳ සලකුණු ය. අන්‍යොන්‍ය යුතුකම් ඉටු කිරීම මත පදනම් වන ස්වාමි සේවක සම්බන්ධය ඒ දෙපිරිසට පමණක් නොව මුළු මහත් සමාජයට ම ඉතා අගනේ ය.

අපි මුලින් ම බුදුරදුන් විසින් පෙන්වා දෙන ලද ස්වාමි සේවක යුතුකම් කවරේ දැයි විමසා බලමු. ස්වාමියා තම සේවකයන් කෙරෙහි පහත සඳහන් යුතුකම් ඉටු කළ යුතු ය.

1. සේවකයාගේ ශක්තියට අනුරූප වැඩ / සේවා පැවරීම
2. ආහාර හා වේතන ලබා දීම
3. සෞඛ්‍ය පහසුකම් ලබා දීම
4. විශේෂ රසකැවිලි ආදිය ඔවුන් සමඟ බෙදා ගැනීම
5. (ප්‍රමාණය ඉක්මවා වැඩ නොගෙන) නිසි වෙලාවට සේවාවෙන් මුදා හැරීම

මෙසේ සලකනු ලැබූ කල්හි සේවකයා විසින් පහත සඳහන් ආකාරයෙන් තම ස්වාමියාහට යුතුකම් ඉටු කළ යුතු ය.

1. ස්වාමියාට පෙර පිබිදීම
2. ස්වාමියාට පසුව නින්දට යාම
3. දුන් දෙය පමණක් ගැනීම
4. තම සේවාව නිසි පරිදි සැපයීම
5. ස්වාමියාගේ කීර්තිය හා හොඳ නම පැතිරවීම

මෙම ස්වාමි සේවක යුතුකම් ඉපැරණි ඉන්දියාවෙහි ගෘහාශ්‍රිත ව පැවැති ස්වාමි සේවක සම්බන්ධතාව පදනම් කොට ගෙන ඉදිරිපත් කොට ඇති බව පෙනේ. එහෙත් වර්තමාන සමාජයෙහි කාර්මිකකරණය යටතෙහි ඉතා විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන විශාල කර්මාන්ත ශාලාවල ස්වාමි සේවක සම්බන්ධය අතිශයින් සංකීර්ණ වුවත් බුදුරදුන් පෙන්වා දුන් මෙම කරුණු නූතන ලෝකයට ද අදාළ වන සේ අර්ථකථනය කළ හැකි ය. අන්‍යොන්‍ය සුහදත්වය හා අන්‍යොන්‍ය සුහසිද්ධිය සිගාලෝවාද සූත්‍රයෙහි දක්වෙන ස්වාමි සේවක යුතුකම්වල පදනම වේ. එම පදනම එදාට මෙන් ම අදටත් එකසේ අදාළ වේ. එහෙයින් මෙම උපදෙස්වල වචන නොව හරය ස්වාමි සේවක සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා යොදා ගත යුතු ය.

## 4.2.4 සාරාංශය

යහපත් සමාජ සම්බන්ධතා ගොඩ නගා ගන්නේ කෙසේ ද යන්න මෙම පාඩම් ඒකකයෙන් අප විසින් සාකච්ඡා කරන ලදී. එම සම්බන්ධතා අතර ඉතා වැදගත් අංග දෙකක් වන ස්වාමිපුරුෂ භාර්යා සම්බන්ධයත්, ස්වාමි සේවක සම්බන්ධයත් පිළිබඳ ව අපි විස්තරාත්මක ව හැදෑරුවෙමු.

මෙම යුතුකම් සමාජය නැමැති රථයෙහි රෝදය ඉවතට යාමෙන් වළක්වාලන කඩ ඇණයට සමාන කොට ඇත. යුතුකම් ඉටු නො කළහොත් සමාජයෙහි ගමන අතරමග ඇනහිටී. ස්වාමිපුරුෂ භාර්යා සම්බන්ධය කඩවුවහොත් එම පවුල ම විනාශ වේ. ස්වාමි සේවක සම්බන්ධය කඩ වුවහොත් රටක මුළු මහත් ආර්ථික ක්‍රියාවලිය ම නතර විය හැකි ය. එහෙයින් මෙම අංග දෙකට අදාළ යුතුකම් ඉටු කිරීම විශේෂයෙන් ම සමාජ සුභ සිද්ධිය පිණිස අතිශයින් ම හේතු වන බව කිව යුතු ය.

### අභ්‍යාස

1. ගෘහ පරිසරය සමකාමී ව පවත්වා ගැනීමට ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් මොනවාදැයි දක්වන්න.
2. වර්ජනවලින් තොර සාමකාමී සමාජ මෙහෙවරක් සඳහා ඉටුවිය යුතු සේව්‍ය සේවක යුතුකම් හා වගකීම් මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.
3. ඔබ කිසියම් ආයතනයක සේවකයකු නම් එම ආයතනයේ දියුණුව සඳහා ඔබ ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරන්න.

### පැවරුම්

1. "සමාජයේ පුද්ගලයකුට හුදෙකලාව ජීවත් විය නොහැක." මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වමින් පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.
2. ප්‍රීතිමත් ගෘහ ජීවිතයකට........ මේ තේමාව යටතේ සිගාලෝවාද සූත්‍රය ඇසුරු කරගෙන උදෑසන රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා දේශනයක් පිළියෙල කරන්න.
3. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කරන්න.
   i. සුභ සිද්ධිය ii. අන්‍යොන්‍ය යුතුකම් iii. ශ්‍රද්ධාව
   iv. කාර්මිකකරණය v. බෞද්ධ ආර්ථිකය

### අතිරේක කියවීම්

1. සිගාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
2. වෙළුද්වාර සූත්‍රය (සංයුක්ත නිකාය සෝතාපත්ති සංයුත්ත)
3. බුදුදහමේ මූලික ඉගැන්වීම් (ධර්මසේන හෙට්ටිආරච්චි හා ගුණසේන මහතන්ත්‍රීගේ)
4. පාඨශාලීය සද්ධර්මකෝෂය (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2002)